සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade	10 ශ්‍රේණිය	වාණිජ අධ්‍යයනය I -II	කාලය / நேரம் / Time	පැය 03

නම / பெயர் / Name ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

වාණිජ අධ්‍යයනය 1

උපදෙස්

- අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි.
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක **1** සිට **40** තෙක් ප්‍රශ්න වල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) යොදන්න.

---

1. පරිසරයේ සංසිද්ධි පිළිබඳව පුද්ගලයන් දකින ආකාරය, සිතන ආකාරය, තර්ක කරන ආකාරය සහ ක්‍රියා කරන ආකාරය පිළිබඳව ගොඩ නැගෙන සංකල්පය වනුයේ,
   (1). ව්‍යාපාර සංකල්පයයි
   (2). නිෂ්පාදන සංකල්පය
   (3). ව්‍යවසායකත්ව සංකල්පයයි
   (4). නවෝත්පාදන සංකල්පය

2. භාණ්ඩ හා සේවා බිහි කිරීමේ ක්‍රියාවලිය සඳහා යොදා ගන්නා විවිධ සම්පත් ඇතුළත් නිවැරදි පිළිතුර වනුයේ,
   (1). භූමිය, ශ්‍රමය, වැටුප්, බදු කුලිය
   (2). භූමිය, ව්‍යවසායකත්වය, පොළිය, ලාභ
   (3). භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, , ව්‍යවසායකත්වය
   (4). බදු කුලිය, වැටුප්, පොලිය, ලාභ

3. භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සඳහා නිෂ්පාදන සාධක අවශ්‍ය වේ. ඒ අතුරින් පොළිය ඉපයීම ලැබෙනුයේ කුමන නිෂ්පාදන සාධකයටද?
   (1). භූමියටය
   (2). සේවාවලටය
   (3). වැටුපටය
   (4). ප්‍රාග්ධනයටය

4. නිර්මාණශීලිත්වය ව්‍යවසායකයකු තුළ තිබිය යුතු අත්‍යවශ්‍ය ගුණාංගයකි. නිර්මාණශීලීත්වයට බාධාකාරී වන සාධකයක් වනුයේ,
   (1). ක්ෂණික ප්‍රතිඵල අපේක්ෂා නොකිරීම
   (2). වැරදි හා විවේචන සඳහා ඇති බිය
   (3). ප්‍රායෝගික වීමට බාධා නැතැයි සිතීම
   (4). තර්කානුකූල පදනමක පිහිටා කටයුතු කිරීම

5. LED බල්බ යෙදූ වෙසක් තොරණ, ස්වයං සේවා අලෙවි ක්‍රමය, නවෝත්පාදන සිදුවන ආකාරවලින් පිළිවළින් අයත් වනුයේ,
   (1). නව සොයා ගැනීමක් හා දිගුවකි
   (2). දිගුවක් හා සංකලනයකි
   (3). සංකලනයක් හා දිගුවකි
   (4). සංකලනයක් හා නව සොයා ගැනීමකි

6. ව්‍යවසායකත්වයේ ප්‍රධාන අරමුණක් විය යුත්තේ,
   (1). තමාට මෙන්ම සමාජයටද යහපතක් කිරීමය
   (2). ව්‍යාපාරික කටයුතු වලින් ලාභ ඉපැයීමය
   (3). පරිසර සුරක්ෂිත කිරීමය
   (4). තම ව්‍යාපාරය දියුණු කර ගැනීමය

Past Papers Wiki

7. ව්‍යවසායකයින් තුළ පොදුවේ දක්නට ලැබෙන ගති ලක්ෂණවලට උදාහරණ වනුයේ,
   (1). කැපවීම, සාමාන්‍ය වැටහීම හා ආත්ම විශ්වාසයයි
   (2). ආත්ම විශ්වාසය, නම්‍යශීලිත්වය හා කැපවීමයි
   (3). කැපවීම, සාමාන්‍ය වැටහීම මහා ස්වාධීනත්වයයි
   (4). සුභවාදී බව, කැපවීම හා ස්වයං පෙළඹවීමයි

8. පුද්ගලයකුගේ නිරිමාණශීලිත්වය වර්ධනය කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ගයක් වන්නේ,
   (1). නවොත්පාදන සිදු නොවීම
   (2). ගැටලු අභියෝග ලෙස දැකීම
   (3). ක්ෂණික ප්‍රතිඵල අපේක්ෂා කිරීම
   (4). විවේචන සඳහා ඇති බිය

9. මිනිසාගේ ජීවිතය පවත්වාගෙන යාමට අනිවාර්යයෙන්ම සපුරා ගත යුතු දේ හා ඒවා සපුරා ගන්නා ආකාර හැඳින්වීමට පිළිවෙලින් දැක්විය හැක්කේ,
   (1). වුවමනා හා අවශ්‍යතා ලෙසයි
   (2). භාණ්ඩ හා සේවා ලෙසයි
   (3). සේවා හා භාණ්ඩ ලෙසයි
   (4). අවශ්‍යතා හා වුවමනා ලෙසයි

10. ව්‍යවසායකයා හා ව්‍යාපාරිකයා අතර සමානකමක් ලෙස දැක්විය හැක්කේ,
   (1). තරගය කැමැත්තේන් සොයා යාම.
   (2). ඉතා ආසන්න ඉලක්ක ඇති කර ගැනීම.
   (3). ගැටලු නිරිමාණශීලිව විසඳීම.
   (4). සම්පත් භාවිත කිරීම.

11. ව්‍යවසායකයින් වර්ගය හා නොගැලපෙන ප්‍රකාශය තෝරන්න
   (1). ව්‍යාපාර ව්‍යවසායකයා - සිල්ලර වෙළඳ ව්‍යාපාරිකයා
   (2). අභ්‍යන්තර ව්‍යවසායකයා - ඵලදායිතා සම්මානලාභී විදුහල්පති
   (3). සමාජයීය ව්‍යවසායකයා - සිල්ලර වෙළඳ ව්‍යාපාරිකයා
   (4). සමාජයීය ව්‍යවසායකයා - කන්නන්ගර මැතිතුමා

12. ව්‍යවසායකයෙකුට සමාජයීය සුභසාධනය සඳහා දායක විය හැකි ආකාරයක් වනුයේ,
   (1). නිවාස අහිමි වූවන්ට නිවාස සාදා දීමෙනි
   (2). නව ව්‍යාපාර අවස්ථා සහ පවතින ව්‍යාපාර අවසථා පුළුල් කිරීමෙනි
   (3). සමාජයීය වශයෙන් පවතින පිළිගැනීම වැඩි කිරීමෙනි
   (4). කීර්ති ප්‍රශංසා ලැබීම තුළිනි

13. "ව්‍යවසායකත්වය තුලින් විවිධ ප්‍රතිලාභ හිමි වේ. " ව්‍යවසායකත්වය නිසා රටේ ආර්ථිකයට හිමිවන ප්‍රතිලාභයක් වන්නේ,
   (1). ස්වයංපෝෂිත බවයි
   (2). ආදායම් බෙදී යාමේ විෂමතා අඩු වීමයි
   (3). නිදහස තුළින් ලැබෙන තෘප්තියයි
   (4). කාර්යයන්හි පවතින විවිධත්වයයි

14. වර්ථමානයේ වෙළඳපොළ තුළ පවතින පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා සපුරාලීමට නොහැකි වූ වෙළඳපොළ කොටස හැඳින්වෙනුයේ,
   (1). ඉලක්ක වෙළඳපොළ ලෙසයි
   (2). වෙළඳපොළ හිදැස ලෙසයි
   (3). පාරිභොගික ඛණ්ඩනය ලෙසයි
   (4). වෙළඳපොළ ඛණ්ඩනය ලෙසයි

15. පරිමාණය අනුව ව්‍යාපාර වර්ග කරනුයේ,
   (1). සුළු පරිමාණ, කුඩා පරිමාණ, මහා පරිමාණ ලෙසයි
   (2). කුඩා පරිමාණ, මධ්‍ය පරිමාණ, මහා පරිමාණ ලෙසයි
   (3). සුළු පරිමාණ, මහා පරිමාණ, කුඩා පරිමාණ ලෙසයි
   (4). විශාල පරිමාණ, මහා පරිමාණ, මධ්‍ය පරිමාණ ලෙසයි

16. කුඩා ව්‍යාපාර වල ගති ලක්ෂණයක් වන්නේ,
   (1). ව්‍යාපාරය තනි අයිතිකරුවෙක් සතු වීම
   (2). විශාල ප්‍රාග්ධනයක් යොදවා තිබීම
   (3). සේවක සංඛ්‍යාව වැඩි වීම
   (4). විශාල ප්‍රදේශයකට පමණක් සීමා වීම

17. ව්‍යාපාරයක් ආරම්භ කොට පවත්වාගෙන යාම සඳහා යොදා ගන්නා සහ යොදා ගත හැකි සියලුම වාසිදායක සාධක හඳුන්වනුයේ,

(1). දුර්වලතා ලෙසයි
(2). කැපවීම ලෙසයි
(3). තර්ජන ලෙසයි
(4). ශක්තීන් ලෙසයි

18. යම් කටයුත්තක් ඉටු කිරීමේදී එයට අදාළව එක් එක් පාර්ශවය විසින් ඉටු කළ යුතු කාර්‍යභාරයක් පවතී. කුඩා පරිමාණ ව්‍යාපාර කටයුතු කරන විටදී ව්‍යවසායකයකු ලෙස ඉටු කරනු ලබන එම කාර්‍යභාරය හඳුන්වන්නේ,

(1). අයිතිකරුගේ භූමිකාව
(2). ව්‍යවසායකයෙකුගේ භූමිකාව
(3). කළමණාකරුගේ භූමිකාව
(4). නායකයාගේ භූමිකාව

19. ව්‍යවසායකයෙකු ලෙස ව්‍යාපාරයේ විවිධ කාර්යයන්හි නියැලී සේවකයන් පෙළඹවීම හා අවශ්‍ය මඟ පෙන්වීම සිදු කරමින් සිය කාර්යභාරය ඉටු කරන්නේ නම් එය හඳුන්වන්නේ,

(1). අයිතිකරුගේ භූමිකාව ලෙසයි
(2). කළමණාකරුගේ භූමිකාව ලෙසයි
(3). නායකයාගේ භූමිකාව ලෙසයි
(4). සේවකයාගේ භූමිකාව ලෙසයි

20. පහත සඳහන් ප්‍රකාශයඋචිත පරිදි ගැලපූ විට නිවැරදි පිළිතුර වනුයේ,

"අ"	"ආ"
1. විධිමත් පටිපාටියක් අනුව හොඳ සේවකයෙකු බඳවා ගැනීම	(a) සංකල්පනාත්මක කුසලතා
2. පුද්ගලයන් සමග යහපත් අන්තර් පුද්ගල සබඳතා පවත්වා ගැනීම	(b) සන්නිවේදන කුසලතා
3. නව වෙළඳපොළ සොයා ගැනීම	(c) තාක්ෂණික කුසලතා
4. රැස්වීම් පැවැත්වීම	(d) මානව කුසලතා

(1). 1 – c, 2 – d , 3 – b , 4 – a
(2). 1 – c , 2 – b , 3 – a , 4 - b
(3). 1 – c, 2 – b , 3 – a , 4 – d
(4). 1 – d, 2 – c , 3 – a , 4 – b

21. ව්‍යාපාරය සමස්තයක් ලෙස සලතා බලමින් අනාගතයේදී ව්‍යාපාරික කටයුතු සාර්ථක කර ගැනීමට අවශ්‍ය තීරණ ගැනීම, ඒවා වැඩි දියුණු කිරීම හා ඊට අවශ්‍ය උපාය මාර්ග තීරණය කිරීම හඳුන්වනුයේ,

(1). සංකල්පනාත්මක කුසලතා ලෙසයි
(2). මානව කුසලතා ලෙසයි
(3). උපදේශන කුසලතා ලෙසයි
(4). තාක්ෂණික කුසලතා ලෙසයි

22. අතීතයේ ව්‍යාපාර පරිසරයට වඩා ප්‍රබල වෙනස්කම් නූතන ව්‍යාපාර පරිසරය තුළ දැකිය හැකිය. නූතන ව්‍යාපාර පරිසරය තුළ දැකිය හැකිය. නූතන ව්‍යාපාර පරිසරයට වඩා අතීත ව්‍යාපාර පරිසරයේ පැවති ලක්ෂණයක් වනුයේ,

(1). පාරිභෝගිකයන් බලවත් විය
(2). ව්‍යාපාරිකයකන් බලවත් විය
(3). ගෝලීය වශයෙන් ව්‍යාප්ත විය
(4). ඉතා ඉක්මනින් වෙනස් විය

23. ව්‍යාපාර පරිසරය නිරන්තරයෙන් වෙනස් වීම් වලට ලක්වේ. ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරය තුළ දක්නට ලැබෙන සාධක පමණක් අඩංගු පිළිතුර වනුයේ,

(1). අයිතිකරුවෝ , තරගකරුවෝ , සේවකයෝ , කළමණාකරුවෝ
(2). අයිතිකරුවෝ , කළමණාකරුවෝ , සේවකයෝ , නායකයෝ
(3). අයිතිකරුවෝ , කළමණාකරුවෝ , සේවකයෝ , සම්පත්
(4). අයිතිකරුවෝ , ගන්දෙනුකරුවෝ , සේවකයෝ , සම්පත්

24. ව්‍යාපාරයක බාහිර පරිසරය තුළ ඇති අවාසිදායක සාධක හඳුන්වනුයේ,
(1). ශක්තියක් ලෙසයි
(2). දුර්වලතා ලෙසයි
(3). අවස්තා ලෙසයි
(4). තර්ජන ලෙසයි

25. රටක ජන සංයුතියෙහි වැඩිහිටි ජනගහනය වැඩි වීම ළමුන් සඳහා වන නිෂ්පාදිතවල නිරත ව්‍යාපාරිකයන්ට බලපෑම් එල්ල කරයි. මෙය අයත් ව්‍යාපාර පරිසර සාධකයක් වන්නේ,
(1). ආර්ථික පරිසරය
(2). සමාජ හා සංස්කෘතික පරිසරය
(3). දේශපාලන පරිසරය
(4). ප්‍රජා පරිසරය

26. ව්‍යාපාර පරිසරය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න
(1). අන්තර්ජාතික වෙළඳපොලට පිවිසීමට ඇති ඉඩකඩ වැඩිවීම ගෝලීය පරිසරයේ තර්ජනයකි
(2). නිර්මාංශ ආහාර පරිභෝජනය කරන පිරිස වැඩිවීම මාංශ ආහාර නිපදවන අයට අවස්තාවකි
(3). රජය විසින් බදු අනුපාතය ඉහළ නැංවීම ව්‍යාපාර වලට තර්ජනයකි
(4). ණය පොලී අනුපාතික වැඩි වීම ව්‍යාපාරවලට අවස්ථාවකි

27. ශ්‍රී ලංකා ආර්ථිකයේ පවතින ප්‍රධාන ව්‍යාපාර අංශ වනුයේ,
(1). ප්‍රාථමික, ද්විතියික හා තෘතීයික වේ
(2). ප්‍රාථමික, ද්විතියික හා සේවා වේ
(3). කෘෂි කාර්මික, කාර්මික හා සේවා වේ
(4). කෘෂි, ධීවර හා පතල් වේ

28. ශ්‍රී ලංකාව තුළ ව්‍යවසායකයින් විසින් ප්‍රයෝජනයට ගත් සහ නොගත් සම්පත් බොහෝ ඇත. මේවා අයත් කාණ්ඩ වනුයේ,
(1). ස්වාභාවික සහ ස්වාභාවික නොවන සම්පත්
(2). මානව සම්පත් සහ මානව නොවන සම්පත්
(3). මානව සම්පත් සහ ස්වාභාවික සම්පත්
(4). ස්වාභාවික සම්පත් සහ බනිජ සම්පත්

29. ස්වාභාවික පරිසරය තුලින් ලබා ගන්නා ස්වාභාවික සම්පත් වල ස්වරූපය වෙනස්කම්වලට භාජනය කිරීමේ කටයුතුවල යෙදී සිටින කර්මාන්ත අයත් වන්නේ,
(1). ප්‍රාථමික අංශයටයි
(2). ද්විතියික අංශයටයි
(3). තෘතියික අංශයටයි
(4). සේවා අංශයටයි

30. ව්‍යාපාරයක මානව සම්පත අනෙකුත් සම්පත්වලට වඩා සුවිශේෂී සම්පතක් වේ. මානව සම්පත ලෙස හඳුන්වන්නේ ආයතනය තුළ සිටින,
(1). කළමණාකරුවන් සහ අයිතිකරුවන්
(2). සේවකයන් සහ අයිතිකරුවන්
(3). කළමණාකරුවන් සහ කළමණාකරුවන් නොවන සේවකයන්
(4). කළමණාකරුවන් සහ ණයහිමියන්

31. ව්‍යාපාරිකයා ඉදිරිපත් කරන භාණ්ඩය හෝ සේවාව දැනටමත් පරිභෝජනය කරන පිරිස හා අනාගතයේ පරිභෝජනය කිරීමට ඉඩ ඇති පාරිභෝගික පිරිස හඳුන්වන්නේ,
(1). ඉලක්ක නිෂ්පාදිතයයි
(2). ඉලක්ක අලෙවියයි
(3). ඉලක්කගත පාරිභෝගිකයායි
(4). නිෂ්පාදිත අලෙවියයි

32. නව ව්‍යාපාරිකයෙකුට ප්‍රාග්ධනය සම්පාදනය කර ගත හැකි වඩාත්ම සාර්ථක ක්‍රමවේදයකි,
(1). ස්වකීය ඉතුරුම්
(2). ඉහළ පොළියකට ණය
(3). ඇප සුරැකුම් සහිත ණය
(4). වත්කම් බද්දට ගැනීම

33. අභ්‍යවකාශ සංචාරක සේවාවක් ඇරඹීම නව ව්‍යවසායකයෙකුට වෙළඳපොළට ප්‍රවේශ විය හැකි ක්‍රමවේද අතරින් අයත් වනුයේ,
(1). නව භාණ්ඩයක් හෝ සේවාවක් පවතින වෙළඳපොළට
(2). පවතින භාණ්ඩයක් හෝ සේවාවක් නව වෙළඳපොළට
(3). පවතින භාණ්ඩයක් හෝ සේවාවක් පවතින වෙළඳපොළට
(4). නව භාණ්ඩයක් හෝ සේවාවක් නව වෙළඳපොළට

34. SCAMPER ආකෘතියට අනුව ෂැම්පු සැමේ පැකට් අයත් නව්‍යකරණ මග පෙන්වීම වනුයේ,

(1). ආදේශ කිරීම
(2). සම්බන්ධ කිරීම
(3). ඉවත් කිරීම
(4). කුඩා කිරීම

35.

(අ)	(ආ)
1. Jambo pack කිරි පිටි	a. වෙළඳපෙලෙ නිඩැස
2. ජ්‍යෙෂ්ඨ පුරවැසි ගිණුම	b. සුවිශේෂී නව භාණ්ඩයක් හෝ සේවාව
3. නිර්පාංශු වගාව	c. නිෂ්පාදිත ප්‍රභේදනය
4. එක් අග්‍රයකලියන තීන්ත, අනෙක් අග්‍රයේ මකන දියර සහිත පැනක්	d. නවොත්පාදනය

ඉහත ප්‍රකාශ නිවැරදි ලෙස ගැලපූ විට නිවැරදි පිළිතුර වනුයේ,

(1). 1 – c , 2 – b , 3 – a , 4 – d
(2). 1 – c , 2 - a , 3 – b , 4 – d
(3). 1 – c , 2 – d , 3 – a , 4 – b
(4). 1 – c , 2 – a , 3 – d , 4 – b

36. පරිසරයේ ඇති ගැටලුවකට විසඳුමක් වන පුද්ගල අවශ්‍යතා හා වුවමනා සපුරාලන වාණිජමය වටිනාකමක් ඇති සිතුවිල්ල හඳුන්වන්නේ,

(1). ව්‍යාපාර අදහසක් ලෙසයි
(2). ව්‍යාපාර අවස්ථාවක් ලෙසයි
(3). ව්‍යාපාර සිතුවිල්ලක් ලෙසයි
(4). ව්‍යාපාර සංකල්පය ලෙසයි

37. හොඳ ව්‍යාපාර අවස්ථාවක ලක්ෂණයකි,

(1). ඉල්ලුමක් නොමැති වීම
(2). හොඳ ඉල්ලුමක් තිබීම
(3). තාක්ෂණය සමඟ ගැලපීම
(4). තරගයක් නොමැති වීම

38. යෝග්‍ය ව්‍යාපාර අවස්ථාවක් තෝරා ගැනීමේ ක්‍රියාවලියට ආතුළත්නොවන විශ්ලේෂණය වන්නේ,

(1). සාර්ව විශ්ලේෂණය
(2). ප්‍රතිඵල විශ්ලේෂණය
(3). සූක්ෂම විශ්ලේෂණය
(4). ශදුඅත විශ්ලේෂණය

39. එක් නිෂ්පාදිතයකට සමානව වෙළඳපොළට ඉදිරිපත් කරන නිෂ්පාදන හෝ ආදේශක නිෂ්පාදිත ඉදිරිපත් කරන පුද්ගලයන් හෝ ආයතන හඳුන්වන්නේ,

(1). ගනුදෙන්කරුවන්
(2). තරගකරුවන්
(3). නිෂ්පාදකයන්
(4). සැපයුම්කරුවන්

40. පේටන්ට් බලපත්‍රයක වලංගු කාලය වන්නේ,

(1). අවුරුදු 30 කි
(2). අවුරුදු 10 කි
(3). අවුරුදු 15 කි
(4). අවුරුදු 20 කි

Past Papers Wiki

Past Papers Wiki

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை -2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade	10 ශ්‍රේණිය	කාලය / நேரம் / Time
	ව්‍යවසායකත්ව අධ්‍යයනය I -II	

නම / பெயர் / Name ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

ව්‍යවසායකත්ව අධ්‍යයනය II

උපදෙස්

- ❖ පළමු ප්‍රශ්නය ඇතුළු ඕනෑම ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.

---

1) "පොලිතින් මළු වෙළඳසැල් මගින් ලබාදීම නොවැම්බර් 01 දා සිට තහනම්."

පොලිතින් බෑග් මගින් පරිසරයට වන හානිය අවම කිරීමට රජය ගෙන ඇති තීරණය ප්‍රයෝජනයට ගත් පසිඳු, තම ප්‍රදේශයේ බහුලව දක්නට ලැබෙන වැටකෙයියා ශාකය උපයෝගී කර ගෙන බෑග් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදහස් කරයි.මෙහිදී පසිඳු, හස්ත කර්මාන්තය පිළිබඳ දැවුරුදු පාඨමාලාවෙන් ලද අත්දැකීම් ප්‍රයෝජනයට ගැනීමට බලාපොරොත්තු වේ.

තම අදහස පිළිබඳව පසිඳු මව සමඟ සාකච්ඡා කල විට ඇයගේ අදහස වුයේ ,ගමේ ජීවත්වන බොහෝ කාන්තාවන් විවිධ රටා සහිත බෑග් නිර්මාණයට උපන් හපන්කම් දක්වන බවයි. එම කාන්තාවන්ගේ දායකත්වය ලබාගෙන පුතු ගේ ව්‍යාපාර අදහස , ව්‍යාපාර අවස්ථාවන් බවට පත්කර ගත හැකි බව මව ගේ අදහසය.

පසිඳුගේ පියා පැවසුවේ තමා ඉතිරි කර ගත් මුදල් රු. 50 000ක් මේ සඳහා ලබා දිය හැකි බවත්, තම නිවසේ ඉදිරිපස කාමරය ඒ සඳහා යොදා ගත හැකි බවත්ය.

බෑග් නිෂ්පාදනයට අවශ්‍ය අමුද්‍රව්‍ය තම ප්‍රදේශයෙන් සාධාරණ මිලකට මිල දි ගත් පසිඳු, විවිධ රටාවක් සහිත බෑග් නිෂ්පාදනයට තම මව ඇතුළු කාන්තාවන් සිව්දෙනෙකු බඳවා ගන්නා ලදී.ඔහු තම නිශ්පාදන ප්‍රදේශයේ පැවැත්වෙනි සතිපොළට රැගෙන ගොස් අලෙවිකිරීම ආරම්භ කල අතර පාසල් ගුරුවරියක් ගෘහණියන් ප්‍රමුඛ කාන්තාවන් මෙම බෑග් මිලදී ගැනීමට වැඩි කැමැත්තක් දක්වන පිරිස අතර විය.

පසිඳු තම ව්‍යාපාරයට අවශ්‍ය සම්පත් නිසි පරිදි යොදවමින්, හොඳ තීරණ ගනිමින්, සේවකයින් හොඳින් මෙහෙයවමින් ව්‍යාපාරය සැලසුම් සහගතව කරමින් සාර්ථකත්වයට පත්ව ඇත.

i) සිද්ධියේ සඳහන් පසිඳු සතු ව්‍යවසායකත්ව ගති ලක්ෂණ දෙකක් ලියන්න.
ii) මෙම ව්‍යාපාරය ආරම්භ කිරීමට පසිඳු සතු වූ ශක්තීන් දෙකක් සඳහන් කරන්න.
iii) a) පසිඳු කුමන ආකාරයේ ව්‍යවසායකයෙක්ද?
b) අනෙකුත් ව්‍යවසායකයින් වර්ගද නම් කරන්න.
iv) මෙම සිද්ධිය තුළ ඔබට දක්නට ලැබෙන ව්‍යවසායකත්ව ප්‍රතිලාභ දෙකක් ලියන්න.
v) a) ශ්‍රී ලංකා ආර්ථිකයේ පවතින ප්‍රධාන ව්‍යාපාර අංශ මොනවාද?
b) පසිඳුගේ මෙම ව්‍යාපාරයේ අයත් වන්නේ ඉන් කුමන ව්‍යාපාර අංශයට ද?
vi) පසිඳුගේ ව්‍යාපාරයේ ඉලක්ක පාරිභෝගිකයන් නම් කරන්න.
vii) මෙම සිද්ධියේ සඳහන් පසිඳුගේ භූමිකා මොනවාද?
viii) මෙම ව්‍යාපාරය ආරම්භ කිරීමට පෙර පසිඳු ගන්නට ඇතැයි ඔබ සිතන වැදගත් තීරණ(4ක්) හතරක් ලියන්න.
ix) පසිඳුගේ මෙම ව්‍යාපාරයට වෙළඳපොළට පිවිසිය හැකි විකල්ප ක්‍රම මොනවාද?
x) පසිඳුගේ මෙම ව්‍යාපාරය බිහිවීමට බලපෑම් කළ පරිසර සාධකය කුමක්ද? (ලකුණු 2X10=20යි)

PAST PAPERS WIKI

2)

i) ව්‍යවසායකත්ව සංකල්පය පිළිබඳව ව්‍යාපාරික දෘෂ්ටිකෝණයෙන් කෙටියෙන් පැහැදිලි කරන්න.

ii) නිෂ්පාදන සාධකය අතුරෙන් ව්‍යවසායකත්වය සුවිශේෂී වන්නේ ඇයි?

iii) නවෝත්පාදනය සඳහා පදනම් වන මූලාශ්‍ර දෙකක් ලියන්න.

iv) "පුද්ගලයෙකුගේ නිර්මාණශීලීත්වය ව්‍යවසායකත්වයේදී ඉතා වැදගත් වේ". එම නිර්මාණශීලීත්වය වර්ධනය කරගත හැකි ආකාර දෙකක් ලියන්න.

v) ඔබේ පාසල අවට ඇති අපතේ යන දේවලින් නවෝත්පාදනයක් සිදුකළ හැකි ආකාරය කෙටියෙන් දක්වන්න.

(ලකුණු 2X5=10)

3)

i) විවිධ ආයතන හෝ පුද්ගලයින් විසින් මිනිස් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කරනු ලබයි. ඒ සඳහා උදව් වන භාණ්ඩ හා සේවා අතර වෙනස්කම් දෙකක් දක්වන්න.

ii) ව්‍යවසායකයා හා ව්‍යාපාරිකයා අතර වෙනස්කම් දෙකක් ලියන්න.

iii) මෑත අවධියේ බෙහෙවින් අවධානයට ලක්ව ඇති අභ්‍යන්තරික ව්‍යවසායකයින් යනුවෙන් හඳුන්වන්නේ කවුරුන්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

iv) " ව්‍යවසායකයා තමාගේ කුසලතා උපයෝගී කරගනිමින් සමාජයටත් රටටත් විවිධ ප්‍රතිලාභ ලබා දේ." ව්‍යවසායකත්වය තුළින් ලැබෙන ප්‍රතිලාභ ප්‍රධාන ආකාර දෙක මොනවාද?

v) ව්‍යවසායකත්ව තුළින් දේශීය ආර්ථිකයට හිමිවන ප්‍රතිලාභ දෙකක් ලියන්න.

(ලකුණු 2X5 =10)

4)

i) කුඩා පරිමාණ ව්‍යාපාර හා ව්‍යවසායකත්වය අතර පවත්නා සම්බන්ධතාව කරුණු දෙකකින් දක්වන්න.

ii) ආර්ථික සංවර්ධනයට කුඩා පරිමාණ ව්‍යාපාර දක්වන දායකත්වය කරුණු දෙකකින් දක්වන්න.

iii) කුඩා ව්‍යාපාරවල දැකිය හැකි සීමා 04ක් ලියන්න.

iv) ව්‍යාපාරයක කළමනාකරුගේ භූමිකාවට අදාළව කාර්යයන් දෙකක් ලියන්න.

v) ව්‍යාපාරයක ආදර්ශවත්ව කටයුතු කිරීමේ කුසලතාවය යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද?

(ලකුණු 2X5 =10)

5)

i) වර්තමාන ව්‍යාපාර පරිසරය තුළ ඇති සැබෑ වෙනස්කම් අවබෝධ කර ගැනීම තුළින් ව්‍යවසායකයාට ප්‍රයෝජන රාශියක් අත් කර ගත හැකිය එවැනි ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න.

ii) ව්‍යාපාරයක ආසන්න පරිසරය ලෙස හඳුන්වන්නේ කුමක්ද ?

iii) පහත සඳහන් ප්‍රකාශ සත්‍යද අසත්‍යද යන්න සඳහන් කරන්න.

a) අයිතිකරුවෝ යනු ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසර සාධකයකි.

b) ව්‍යාපාරයට අභ්‍යන්තර පරිසරයේ ඇති සාධක ලෙස ශක්තීන් හා දුර්වලතා දැක්විය හැකිය.

c) ව්‍යාපාරයකට පාලනය කළ හැකි සාධක ඇතුළත් පරිසරය බාහිර පරිසරයයි.

d) කුසලතාවලින් පරිපූර්ණ කළමනාකරුවන් ව්‍යාපාරයකට දුර්වලතා ගෙන දේ.

iv) ව්‍යාපාරයක බාහිර පරිසරය තුළ ක්‍රියාත්මක වන විද්‍යාත්මක හා තාක්ෂණික පරිසරයට අයත් සාධක දෙකක් ලියන්න.

v) ශ්‍රී ලංකා ආර්ථිකයේ පවතින ප්‍රධාන ව්‍යාපාර අංශයක් වන ද්විතීයික අංශයට අයත් කොටස් 02 ක් නම් කරන්න.

(ලකුණු 2X5 =10)

6)

i) ශ්‍රී ලංකාවේ සුලභ සම්පත් යටතට ගැනෙන මානව නොවන සම්පත් යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද?

ii) සීඝ්‍ර වෙනස්වීම් සමග පුළුල් වන ව්‍යාපාර ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා හතරක් ලියන්න.

iii) ව්‍යාපාරයක් ආරම්භ කිරීමේදී ව්‍යාපාරයේ ස්ථාපිත කරන්නේ කෙබඳු ස්ථානයකද යන්න තීරණය කිරීමේ දී සලකා බලන සාධක දෙකක් ලියන්න.

iv) නව ව්‍යවසායකයෙකුට වෙළඳපොළට ප්‍රවේශ විය හැකි පිවිසුම් උපාය මාර්ග අතරින් පවතින භාණ්ඩයක් හෝ සේවාවක් නව වෙළඳපොළට ඉදිරිපත් කිරීමේ වාසියක් හා අවාසියක් ලියන්න.

v) "ව්‍යවසායකයෙකු ව්‍යාපාර ආරම්භ කරන්නේ ඉපැයීමක් බලාපොරොත්තුවෙනි." ව්‍යවසායකයෙකුට ප්‍රමාණවත් ඉපයීමක් අවශ්‍ය වන්නේ ඇයි ? කරුණු දෙකක් දක්වන්න.

(ලකුණු 2X5=10)

7)

i) "අදහස් ශත 10ට දුසිමක් ගත හැකිය." මෙය ව්‍යාපාර ක්ෂේත්‍රයේ පවතින කියමනකි. මින් ගම්‍ය වන්නේ කුමක්ද?

ii) ව්‍යවසායකයෙකුට ව්‍යාපාර අදහස් පහළ විය හැකි මූලාශ්‍ර දෙකක් ලියන්න.

iii) හොඳ ව්‍යාපාර අදහසක් තෝරා ගැනීම පියවර තුනකින් යුත් ක්‍රියාවලියකි එම පියවර තුන නම් කරන්න.

iv) හොඳ ව්‍යාපාර අදහසක ලක්ෂණ දෙකක් ලියන්න.

v) පේටන්ට් බලපත්‍රය යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද?

(ලකුණු 2X5=10)

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library